# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/72 - 2017 ජනවාරි මස 20 වැනි සිකුරාදා - 2017.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක පී. වී. 62877 සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2016 ජූලි මස 14 වැනි දින අංක 1975/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය'' යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූපී සටහනට ද ඉක්බිතිව ම පහත I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, පහත II වන උපලේඛනයේ දැක්වෙන අයිතම පිළිවෙලින් එකතු කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*I වන උපලේඛනය*

**කොන්දේසි**

හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ අංක 995 ප්‍රකාර, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 3ක් එක්වර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම යන්නට අනුකූල විය යුතු ය.

*II වන උපලේඛනය*

| *"I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධිය* | *උපාධි සඳහා කෙටි යෙදුම්* |
| ආහාර සුරක්ෂිතතාව, ශාක හා සත්ත්ව ස්වස්ථතාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව | පී ජී ඩිප් (ආහාර සුරක්ෂිතතාව, ශාක හා සත්ත්ව සවස්ථතාව) |
| ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, | බී එස් සී (ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2017 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

02 - 307

1A - PG 3358 — 507 (2017/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*